# ජාතික තරුණ සේවා සභාව

## තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය

## 2026 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම.

ජාතික තරුණ සේවා සභාව 2026 වර්ෂය සඳහා භාණ්ඩ හා සේවා සැපයීම සඳහා අනුමත නියෝජිතයින්, කොන්ත්‍රාත්කරුවන්, සැපයුම්කරුවන් ලියාපදිංචි කරගැනීම සඳහා **www.nysc.lk** වෙබ් අඩවියෙහි සඳහන් කාණ්ඩ යටතේ ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

**කොන්දේසි -**

- ජාතික තරුණ සේවා සභාවේ ලියාපදිංචි සැපයුම්කරුවෙකු වීම සඳහා සරප් අංශය වෙත ආපසු නොගෙවන රු.250.00 ක මුදලක් ගෙවා ප්‍රසම්පාදන අංශය වෙත ඉදිරිපත් කර අයදුම්පතක් ලබාගත යුතු අතර, එසේ නැතහොත් පහත සඳහන් කර ඇති ගිණුම් අංකයට මුදල් ගිණුම් ගත කර වෙබ් අඩවිය මගින් අයදුම්පත බාගත කර ගත හැක. (**ගිණුම් අංකය - 306100130536546- මහජන බැංකුව - මහරගම**)

- ප්‍රසම්පාදන අංශය මගින් අයදුම්පත නිකුත් කිරීම හා මුදල් **ගෙවීම 2026.01.18 දින සිට 2026.02.09 දක්වා පෙ.ව 9.00 සිට ප.ව 2.30 දක්වා** සිදු කරනු ලැබේ.

- ඔබ කාණ්ඩයන් කිහිපයක් යටතේ ලියාපදිංචි වන්නේ නම් එම එක් එක් කාණ්ඩයන් සඳහා රු.250 බැගින් වෙන වෙනම මුදල් ගෙවා අයදුම්පත් ලබා ගත යුතුය.

- බැංකුව වෙත මුදල් ගෙවන්නේ නම්, සම්පූර්ණ මුදල ගිණුම් ගත කර, වෙන වෙනම කාණ්ඩ අංක සඳහා අයදුම්පත් වෙබ් අඩවියෙන් ලබාගෙන ගෙවූ රිසිට්පත ඡායා පිටපත් කර, අනෙකුත් ලියවිලි සමඟ වෙන වෙනම ඇමිණිය යුතුය. (බැංකුව වෙත මුදල් ගෙවිය **හැක්කේ 2026.01.18 සිට 2026.02.09 දක්වා** පමණි)

- සම්පූර්ණ කරන ලද අයදුම්පත් **2026.02.10 දින ප.ව.2.00** ට **හෝ එදිනට පෙර** පහත සඳහන් ලේඛන වල ඡායා පිටපත් සමඟ **සභාපති/ අධ්‍යක්ෂ ජනරාල්, ජාතික තරුණ සේවා සභාව, නො.65, හයිලෙවල් පාර, මහරගම** යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් හෝ ජාතික තරුණ සේවා සභාවේ ප්‍රසම්පාදන අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය.

    1. ව්‍යාපාර ලියාපදිංචි සහතිකයේ පිටපත (තනි හිමිකාරත්වය/ හවුල්කාරිත්වය/ පුද්ගලික සීමිත සමාගම)
    2. සංස්ථාගත කිරීමේ සහතිකයේ පිටපත (පෞද්ගලික/ පොදු සීමිත සමාගම් සඳහා අදාළ වේ)
    3. VAT ලියාපදිංචි සහතිකයේ පිටපත් හා අයකිරීම පිළිබඳ වලංගු සහතික පිළිබඳ ඡායා පිටපතක්
    4. අයදුම්පත් ලබා ගැනීමේදී මුදල් ගෙවූ ලදුපතේ පිටපතක්
    5. පලපුරුද්ද පිළිබඳ විස්තර (අත්දැකීම්/ සම්පූර්ණ කරන ලද වැඩ/ වැඩ නිමි ආයතන විස්තර)
    6. ආයතනය පිළිබඳ විස්තරයක් (Company Profile)
    7. වෘත්තීය ලියාපදිංචි සහතික (ICTAD / CIDA, IESL, SLSEA - කාණ්ඩය අනුව)

- ඔබ විසින් සැපයුම්කරුවකු වශයෙන් අයදුම්පත් ඉදිරිපත් කිරීමේ දී අදාල කාණ්ඩයට අනුව ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකය ඉදිරිපත් කළ යුතුය. එසේ නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

- මිල ගණන් කැඳවීමේ දී ලියාපදිංචි තැපැලෙන් හා විද්‍යුත් තැපැල මඟින් මිල ගණන් කැඳවන බැවින් විද්‍යුත් තැපැල් ලිපිනය අනිවාර්යයෙන් පැහැදිලිව සටහන් කල යුතුවේ.

- අසම්පූර්ණ අයදුම්පත් හා **2026.02.10 දින ප.ව.2.00 න් පසුව** ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

- අයදුම්පත් බහාලනු ලබන කවරයේ වම් කෙලවරේ ''**සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම 2026 වර්ෂය - (අයදුම් කරනු ලබන කාණ්ඩය) - ප්‍රසම්පාදන අංශය**'' යනුවෙන් සටහන් කල යුතුය.

**වැඩි විස්තර සඳහා - සහකාර අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන) – 0112-847563**

**සභාපති / අධ්‍යක්ෂ ජනරාල්,**
**ජාතික තරුණ සේවා සභාව**